# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | RG/AB/13/01/EB | |
| | ප්‍රධාන කාර්යාලය<br>தலைமை அலுவலகம்<br>HEAD OFFICE | |
| තැ. පෙ. අංකය<br>த. பெ. இல.<br>P. O. Box No. | 565 | |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | |
| | 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.<br>234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.<br>234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla. | |
| දිනය<br>திகதி<br>Date | 2023.09.26 | |


ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් (පාලන/සිවිල් ලියාපදිංචි/නොතාරිස්)

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

ප්‍රධාන ගණකාධිකාරී

ප්‍රධාන අභ්‍යන්තර විගණක

සියලුම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්

නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන)

සියලුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්

සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)

**<u>ලේඛන සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) – 2023</u>**

2012.07.26 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලේඛන සහකාර තනතුරෙහි බඳවා ගැනීම් පරිපාටියේ 08 වගන්තියෙහි වන 8.1 උප වගන්තියේ සඳහන් අනුකූලව 02 ප්‍රකාරව, ලේඛන සහකාර III ශ්‍රේණියේ නිලධාරීන් විසින් සමත්විය යුතු පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට තීරණය කර ඇත.

02. එබැවින්, මේ පිළිබඳව ඔබ කාර්යාලයේ සේවයෙහි නියුතු ලේඛන සහකාර III ශ්‍රේණියේ නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි. බඳවා ගැනීමේ පරිපාටිය අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා වන ප්‍රශ්න පත්‍රය කාලය පැය 01ක් වන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි (ලේඛන ලියාපදිංචි කිරීම, විවාහ/උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම) ඇසුරෙන් නිර්මාණය කිරීමට නියමිතය.

03. තවද, ලේඛන සහකාර III ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් ඇමුණුමෙහි සඳහන් අයදුම්පත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර ඔබගේ නිර්දේශය ද සමඟ 2023.10.17 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සලස්වන ලෙස වැඩිදුරටත් දන්වමි. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

ඩබ්.ඒ.චමනි වික්‍රමතිලක
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට


දුරකථන - 0112072038
ෆැක්ස් - 0112889493
විද්‍යුත් තැපැල - admin@rgd.gov.lk